# පාස්කු සතියේ
# සෙනසුරාදා

## පළමුවන දේව ප්‍රකාශනය

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් කොටසකි. ක්‍රියා 4 : 13 – 21

අප ඇසූ දුටු දේ ප්‍රකාශ නොකර සිටින්නට අපට නුපුළුවන.

උගත්කමක් නැති සාමාන්‍ය මිනිසුන් වශයෙන් සිටි පේදුරුගේ ද ජොහන්ගේ ද නිර්භීතකම දුටු ඔව්හු මවිත වූහ. ඔවුන් ජේසුස් වහන්සේ ඇසුරෙහි සිටියවුන් බව ද පෙනී ගියේය. සුවපත් කරනු ලැබූ මිනිසා ඔවුන් සමඟ සිටි බැවින් ඒ දෙදෙනාට විරුද්ධව කිසිවක් කියන්නට ඔවුන්ට නොහැකි විය. එබැවින් මන්ත්‍රණ සභාවෙන් බැහැර යන්නට ඔවුන්ට අණ කර, ඔව්හු තම තමන් අතර සාකච්ඡා කරමින් මෙසේ කීහ. “අපි මේ මිනිසුන්ට කුමක් කරමුද? ඔවුන් විසින් විශිෂ්ඨ, අරුම පුදුම දෙයක් කරන ලද බව ජෙරුසලමෙහි සියලු වැසියන්ට පෙනී ගොස් ඇත. එවැන්නක් නැතැයි කියන්නට අපට නොහැකිය. එබැවින් ජනයා අතර එය තවදුරටත් පතළ නොවන පිණිස මින්පසු මේ නාමයෙන් කිසිම කෙනෙකුට කතා නොකරන මෙන් අපි ඔවුන්ට තර්ජනය කරමු.” ඉන්පසු ඔව්හු ඔවුන් කැඳවා ජේසුස් වහන්සේගේ නාමයෙන් කොහෙත්ම කතා නොකරන මෙන් ද නූගන්වන මෙන්ද ඔවුන්ට අණ කළහ. එහෙත් පේදුරු ද ජොහන් ද පිළිතුරු දෙමින්, “දෙවියන් වහන්සේට කීකරු වීමට වඩා ඔබට කීකරු වීම හරිදැයි දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබ ම විනිශ්චය කරගන්න. මන්ද, අප ඇසූ දුටු දේ ගැන කතා නොකර සිටින්නට අපට නොහැකි ම ය” යි කීහ. ඔව්හු ඔවුන්ට තවදුරටත් තර්ජනය කොට නිදහස් කර යන්නට හැරියෝ ය. සිදු වූ දේ ගැන සියලු දෙනා දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ බැවින්, ජනයා නිසා ඒ දෙදෙනාට දඬුවම් කිරීමට ඔවුන්ට මඟක් නොවීය.

දේව වචනය මෙසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 118 : 1,14-21

පිළිතුර: සමිඳුනි, ඔබ මට පිළිතුරු දුන් බැවින් මම ඔබට ස්තුති කරන්නෙමි.
ආලේලූයා //

ගීය:

සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද, එතුමාණෝ යහපත්ය.
එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේය.
සමිඳාණෝ මාගේ සවිය ද ගීය ද වෙති. එතුමාණෝ මාගේ ගැලවුම්කාරයාණෝය.

ප්‍රීතිවීමේ හා ගැලවීමේ හඬට සවන් දෙන්න. දැමිටුන්ගේ කූඩාරම්වල ජය නාදය ඇසේ. සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.
සමිඳුන්ගේ බාහු බලය උදාර ය. සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.
මම නොනැසී ජීවත්ව සිටින්නෙමි. සමිඳුන්ගේ ක්‍රියා ප්‍රකාශ කරන්නෙමි.

සමිඳාණෝ දැඩි ලෙස මට දඬුවම් දුන් සේක. එහෙත් මරුවාට මා පාවා නුදුන් සේක. දැමිටුකමේ දොරටු මට හැර දෙන්න. එවිට එයින් මම ඇතුල් වී සමිඳුන්ට ස්තුති කරන්නෙමි.

මෙන්න, සමිඳුන්ගේ දොරටුව! දැහැමියෝ එයින් ඇතුල් වන්නෝය. මම ඔබට ස්තුති කරන්නෙමි. මන්ද, ඔබ මට පිළිතුරු දී මාගේ ගැලවීම වූ සේක.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.
ආලේලූයා!

# සුවිශේෂය

මාක්තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

මාක් 16 : 9-15

ලොව පුරා ගොස් සකල සත්වයා හට සුබ අස්න දේශනා කරන්න.

සතියේ පළමු වන දා අලුයම ජේසුස් වහන්සේ නැගිට වදාළ කල, උන් වහන්සේ තමන් විසින් දුෂ්ටාත්මයන් සත් දෙනෙකු දුරු කරනු ලැබූ මග්දලායේ මරියාට මුලින්ම දර්ශනය වූ සේක. ඈ ගොස්, අඬමින් වැලපෙමින් සිටි උන් වහන්සේගේ හිතවතුන්ට එපවත් සැල කළාය. එහෙත් උන් වහන්සේ ජීවමානව සිටින බව ද ඇයට දර්ශනය වූ බව ද ඇසූ විට ඔව්හු එය විශ්වාස නොකළහ. ඉක්බිති ඔවුන්ගෙන් දෙදෙනෙකු පිටිසරට යන කල උන් වහන්සේ අන් විලසකින් ඔවුන්ට දර්ශනය වූ සේක. ඒ දෙදෙන ආපසු ගොස් අනික් අයට එපවත් දැන්වූහ. ඔව්හු ඔවුන් කී දෙය ද විශ්වාස නොකළහ. පසුව ජේසුස් වහන්සේ එකොළොස් දෙනා ආහාර වළඳමින් සිටිය දී ඔවුන්ට ද දර්ශනය වී, උන් වහන්සේ උත්ථාන වූ පසු තමන් වහන්සේ දුටුවන් කී දේ ඔවුන් නොඇදහූ නිසා, ඔවුන්ගේ අවිශ්වාසය හා සිත් දැඩිකම ගැන ඔවුන්ට දොස් පැවරූ සේක. උන්වහන්සේ ඔවුන් අමතා, "ලොව පුරා ගොස් සකල සත්වයා හට සුබ අස්න දේශනා කරන්නැ" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේය.